Page 12 September 2008.qxd 18/09/2008 23:11 Page 1





# රණවිරු ස්මාරකයක් යාපනයේ ඉදිවේ
# 'War Heroes' memorial in Jaffna



*Sri lanka Army Chief paying his respect to the 'War Heroes' memorial*
*ශ්‍රීලංකා හමුදාපතිවරයා රණවිරු ස්මාරකයට තම ගෞරවය පුද කරන යුරු*

Paying utmost tribute to the sacrifices made by the tri-forces personnel and Police in the call of duty, the Army Chief Lieutenant General Sarath Fonseka unveiled the 'War Heroes' memorial at Palaly, during a field visit made to the peninsula this morning, September 6.

The Army Chief was accompanied by the Jaffna Security Forces Commander, Major General G.A Chandrasiri, Divisional Commanders of SLA, Palaly SLAF base Commanding Officer Wing Commander A.J Amarasinghe, Jaffna DIG W.S.U. Fernando and few other senior military officials.

**Above Photographs - courtesy The Defence Ministry - Sri Lanka**

වසර **30** කට ආසන්නව දිවෙන මෙම වාර්ගික යුද්ධයේ දී තම උපන් ජන්ම භූමිය ත්‍රස්තවාදී සතුරන්ගෙන් ආරක්‍ෂා කරගැන්මට ඒ වෙනුවෙන් සටනට වැද ජීවිත පරිත්‍යාග කළ ශ්‍රීලංකා ත්‍රිවිධ හමුදාවේ සහ පොලිස් සේවයේ රණ විරුවන් සියළු දෙනා සිහිපත්කරන රණවිරු ස්මාරකයක් මේ ගිය මස **6** වෙනි දින උදයේ යාපනයේ දී විවෘත කරමින් සේනාධිනායක සරත් පොන් සේකා මහතා තම අත්‍යාධික ගෞරවය දැක්වීය.

හමුදාපතිවරයා සමග යාපනයේ ආරක්‍ෂක ප්‍රධානී මේජර් ජෙනරාල් ජී. ඒ. චන්ද්‍රසිරි ද, ප්‍රාදේශීය හමුදා ප්‍රධානීන්ද, පලාලිහි ගුවන් හමුදා ඒකකයේ අණදෙන නිලධාරී ප්‍රධානි ඒ. ජේ. අමරසිංහ සහ යාපනයේ පොලිස් අංශයේ ප්‍රධානියා වන ඩබ්. එස්. යූ. ප්‍රනාන්දු යන මහත් වරුන් ඇතුළු තවත් නිළධාරීහු රැසක් මෙම විවෘතකිරීමේ උත්සවයට සහභාගි වූහ.

## ප්‍රභාකරන්ගේ බිරිඳ හා දරු දෙදෙනෙක් දකුණු අප්‍රිකාවේ

**කො**ටි නායක වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ බිරිඳ වන මදවදනී ද, දියණිය ද්වාරකා සහ බාල පුතා ද මුහුදු මාර්ගය ඔස්සේ දකුණු අප්‍රිකාවට ගොස් සිටින බව කොටි සංවිධානයේ අභ්‍යන්තරයෙන් එන ආරංචි වලින් ප්‍රකාශ වේ. ඔවුන්ගේ වැඩිමහල් පුත් වන චාල්ස් ඇන්තනි කිලිනොච්චි කැලයේ වෙසෙමින්, තම පියාගේ යුද කටයුතු වලට සහාය වෙමින් ඔහු රැක බලා ගෙන සිටින බව ද සැලවේ.




ප්‍රභාකරන් තම බිරිඳ හා දරුවන් යුරෝපීය රටකට නොයැවූවේ කවුරු හෝ එය දැනගෙන අන වශ්‍ය ප්‍රචාරයදීම නිසා ඒ රටවල රජය යන්ගේ කරදරවලට මුහුණපාන්නට වේය යන සැක නිසායයි ද කියති. 1987 දී ප්‍රභාකරන් සිය බිරිඳ හා දරු තිදෙනා ස්වීඩනයට යවා ඉන්දියානු සාම හමුදාව ශ්‍රීලංකාවෙන් පිට වී යනතුරු එහි නවතා තැබුවේ ය.

## යාපනයේ සිසුන් 300 ක් කොළඹට පැමිණෙති

**අ**වුරුදු 10 කින් ප්‍රථම වරට යාපනයේ සිට පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසක් කොළඹ පැවැත්වෙන අන්තර් පාඨශාලීය ක්‍රීඩා තරඟ වලට සහභාගිවීම සඳහා ගිය සතියේ තම ගුරුවර ගුරුවරියන් සමග පැමිණ ඇත.

යාපනයේ පාසැල් 15 එම සිසු දරුවෝ කන්කසන්තුරේ සිට ත්‍රිකුණාමලයට නැවෙන් පැමිණ, එහි සිට කොළඹට දුම්රියෙන් ළඟා වූහ. ඒ ළමයින් බොහෝ දෙනෙකු කෝච්චියක ගමන් ගත් මුල් වතාව එය වීය. මේ ළමයින් සියල්ලන්ම 1991 දී ඉපදුණු අයය. යාපනය සහ කොළඹ අතර දුම්රිය ධාවනය නැවතුනේ 1990 සිටය. මෙම ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොළඹට ගෙන ඒමට පහසුකම් සැපයුවේ සමාජ සේවා අමාත්‍යංශයයි.

## ♥ පැටියො ඩාලිං



" පැටියො.....අන්න තව කට්ටියක් යූඇන්පී එකෙන් ආණ්ඩුවට පනින්න යනවා. අන්තිමට රනිල් මහත්තෙයා විතරයි ඉතුරුවෙන්නෙ. "
" ඉතිං නරකයැ? එතකොට එයා දිනලා, තනියම ඒක පුද්ගල ආණ්ඩුවක් පිහිටුවාවිනේ. එතකොට වියදමත් අඩුනේ..."

# Sinhala Lesson 125 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### Present Participles made into Adjectives
### මිශ්‍ර ක්‍රියා නාම විශේෂණයට හැරවීම

**Translate into English:**

ගුරුවරු උගන්වන පාඩම් සිසුවෝ ඉගෙන ගනිති.
පොත් කියවන අයගේ දැනීම වැඩිවෙයි.
ඔබ සිතන දේ මම නොදනිමි
අපේ මව උයන කෑම ඉතා රසයි
වැඩට යන මිනිස්සු කලින් ලෑස්තිවන්නෝය
ළමයි තමයි අඳින සිතියම් ගුරුවරියට පෙන්වති
අසනීප වන අය රෝහලට පැමිණෙත්
අක්කා අඬන දරුවා වඩාගත්තාය

**Translate into Sinhala**

Don't wake up ( the sleeping infant / the infant who is sleeping)
I shall sweep ( the falling leaves / the leaves that are falling )
This is (drinking water / water that is for drinking )
They bought some walking dolls / dolls that walk.
Vegetables and fruits are good for (growing children / children who are growing)

♦ ආචාර්‍යා සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

## හරස්පද ප්‍රහේලිකා 102

**හරහට :**
1 දෝෂාරෝපණ
5 කසාදය
7 ගිනි ගොඩවල්
8 අහසේ පිපෙන මල්
10 බාප්පා

**පහළට :**
1 නුරුස්සන
2 මේවා බැඳුණු විට ඇස් නොපෙනේ
3 ඔක්සිජන් මෙයට අයත්ය
4 පරිගණකයට මේවා පුරවති
6 හොඳම වයසට පැමිණි තැනැත්තා
9 ගෙඩි දෙකට කැපූ විට මේවා ලැබේ

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | ■ |
| 5 | | | | 6 |
| 7 | | ■ | 8 | |
| | ■ | 9 | ■ | |
| ■ | 10 | | | |

***ගියවර නිවැරදි විසඳුම්***

**හරහට:** 1 මකරා 4 හර 5 පය 6 පාත්තරය 8 රතවාහන 9 නට
**පහළට:** 1 මහපාර 2 කරත්ත 3 මියයන 5 පරහට 7 තවාන

## නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

### කෙසෙල්මුහ හා කොස්ඇට මාළුව
### A MIXED CURRY

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| කෙසෙල් මුහයක් | |
| රතුළුණු ගෙඩි | 8 ක් |
| බොම්බයි ළූණු ගෙඩි | 2 ක් |
| උම්බලකඩ මේස හැඳි | 3 ක් |
| අමු මිරිස් කරල් (සිහින්ව ලියා ගන්න) | 3 ක් |
| කොස් ඇට | 25 ක් |
| පොල්කිරි කෝප්ප | 2 ක් |
| උළුහාල්, මිරිස්, කහ, සහ තුනපහ ස්වල්පයක් බැගින් | |
| කරපිංචා සහ තෙල් ටිකක් | |

***සාදන ක්‍රමය :*** කෙසෙල් මුහයේ උඩ තිබෙන මේරූ ලෙලි ගළවා ඉවත් කර සිහින්ව ලියාගන්න. කහට ඉවත් කිරීම පිණිස ඒවා ලුණු වතුරේ දමා විනාඩි කීපයක් තබා හොඳින් මිරිකාගන්න. කොස් ඇට සුද්ධකර කෑලිවලට කපා ඊට එක්කරන්න. මේ දෙවර්ගය වළඳකට දමා ඉතිරි කලමනාද ඊට එක්කර වතුරෙන් ලිප තබා තැම්බීගෙන එන විට පොල්කිරි එකතු කර පිසගන්න.

තෙල් ටිකක් ලිප තබා රත්වෙන කල බොම්බයි ළූණු සිහින්ව ලියා ඊට දමන්න. රන්වන්ව බැදීගෙන එන විට කෙසෙල් මුහ ව්‍යංජනය ඊට එකතු කර තෙම්පරාදු කර, ලුණු ඇඹුල් බලා බා ගන්න.

♦ ***දේවිකා අමරසිංහ*** Feltham, Middx, **UK**

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සැම්ස් චිකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432